**ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 274 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබූ මෙම වාර්තාවේ 3.4(අ) හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අමාත්‍යාංශ 18 ක් හා දෙපාර්තමේන්තු 26 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 3,773 ක් හා රු. මිලියන 1,191 ක් ලෙස එකතුව රු.මිලියන 4,964 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 4,735 ක් උපයෝජනය කර රු.මිලියන 229 ක් හෙවත් සියයට 46 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 46 ක් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදය සහ අක්මුදල් වෙන්කර ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මූලධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සීමා කළ නිසා ඉතිරි වීම් සිදු විය. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව උපුල්දෙණිය ධාන්‍ය ගබඩාවේ මෙහෙයුම් වියදම් හා අදාළ වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.12,000,000 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබුණද පැවති ආර්ථික තත්ත්වය හමුවේ වැඩි දියුණු කිරීම සිදු නොකළ නිසා සියයට 46 ක ප්‍රතිපාදන ඉතිරියක් පවතී. | ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කර ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | පානීය ජල අවශ්‍යතා සහිත ග්‍රාම නිලධාරී වසම්වල ප්‍රයෝජනය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක් සඳහා ලබාදී තිබුණු ලීටර් 1000 ජල ටැංකි 97 ක් සහ ලීටර් 500 ජල ටැංකි 11 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය වූ විටෙක පිරිසිදු කර ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සුරක්ෂිතව තබා ඇත. | වත්කම් කාර්යක්ෂමව සහ ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට සහ වත්කම් ආරක්ෂිතව ගබඩා කිරීමට කටයුතු කළයුතු වීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| (i) | XIX වැනි පරිච්ඡේදයේ 6.15 වගන්තිය | - | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින නිල නිවාස 12 ක බදු කාලය වසර 05 ඉක්මවා තිබියදීත් නිවාස ලබාගත් නිලධාරින් අදාළ නිවාසවල රැඳි සිටීමෙන්, රජයේ නිවාස අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ රැඳි සිටින නිලධාරීන් 78 දෙනෙකුට නිල නිවාස ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.12 වගන්තිය අනුව නිවාස වෙන්කර ඇත | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ii)** | XIX වැනි පරිච්ඡේදයේ 7.2 වගන්තිය | | බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචි වී සිටින කාලපරිච්ජේදය සඳහා වැටුපෙන් සියයට 8 ක් සහ ඒ නිවාසය සඳහා තක්සේරු කරනු ලබන වෙළඳපොළ කුලිය ඇතුළත් දණ්ඩන කුලියක් අයකළ යුතු වුවත්, නිවාස 08 ක පදිංචි නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 08 ක දණ්ඩන කුලිය පමණක් අයකරමින් පැවතුණි. | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.12 වගන්තිය අනුව නිවාස වෙන්කර ඇත. පදිංචියට වෙනත් ස්ථානයක් සොයා ගැනීමට පෙළඹවීමක් ලෙස සියයට 8 ක දණ්ඩන කුලියක් අයකරනු ලැබේ. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ බැවින් සංවර්ධන ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලැස්මක්ද, ඊට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙළ නොකරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී අනුරාධපුර දිසාපති නිල නිවසට හා සංචාරක බංගලාවට කිලෝවොට් 05 ක සහ කිලෝවොට් 10 ක ධාරිතාවයකින් යුතු සූර්ය විදුලි බල පද්ධති 02 ක් ස්ථාපිත කිරීම සඳහා රු.2,405,200 ක් වූ ගිවිසුම්ගත මුදල ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 237(අ)(i) ප්‍රකාරව ලංසුකරු එකඟ වූ පිරිවිතර හා කොන්දේසිවලට අනුව සූර්ය විදුලි බල පද්ධතිය ස්ථාපිත කිරීම, පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම, වගකීම් සහතික ඉදිරිපත් කිරීම ආදිය නියමිත පරිදි සිදුකර ඇති බවට තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව සිදු කිරීම හේතුවෙන් 2023 නොවැම්බර් මස සිට විගණිත දින වූ 2024 මාර්තු 01 දින වන විට තෙමසකට වඩා අධික කාලයක සිට අක්‍රීයව පැවති දිසාපති නිල නිවසේ කිලෝවොට් 05 ක ධාරිතාවයකින් යුතු සූර්ය විදුලි බල පද්ධතිය අදාළ වගකීම් සහතික මත නැවත යථා තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම සැපයුමට අදාළ බිල්පත් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය මත පියවීම කර ඇත. 2024 අප්‍රේල් 04 දින විද්‍යුත් තැපැල් පණිවිඩය මඟින් ඉදිරි අලුත්වැඩියා කටයුතු ජාලගතව පරීක්ෂා කිරීමට කටයුතු කර ඇත. | මිලදී ගැනීමේ දී හා සේවා ලබාගැනීමේ දී මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පදිංචි සහ ගොවිතැන් කටයුතු වල නියැලී ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමට හා දැනට ඉඩම් හිමි එහෙත් නීත්‍යානුකූල අයිතිය නොමැති අය සඳහා විධිමත් බලපත්‍ර ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 | 2024 වර්ෂයේ ඉඩම් කච්චේරි පැවැත්වීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නිසි කාලයට ඉඩම් කච්චේරිය පැවැත්විය යුතුය. |

අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කළයුතු වුවත් රඹෑව,මධ්‍යම නුවරගම් පළාත සහ නාච්චාදූව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරී වසම් 32 ක වසර 02 කට හෝ ඊට වැඩි කාලයක සිට ඉඩම් කච්චේරි පවත්වා නොතිබුණි.

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වනිතා සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ණය වැඩ සටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක පශු සම්පත් ණය ලබාදීම සඳහා ආරම්භ කර ඇති බැංකු ගිණුම්වල රු.33,313,252 ක මුදලක් අදාළ කාර්යය සඳහා යෙදවීමට ප්‍රමාණවත් නොවන බව දක්වමින් වසර දෙකකට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ලබාදෙන ණය මුදල රු.100,000 ක් වුවද වර්තමානයේ කිරිගවයෙකුගේ වටිනාකම රු.250,000 ක් පමණ වූයෙන් ප්‍රතිලාභීන් විසින් මෙම ණය මුදල ප්‍රතික්ෂේප කරයි. ඒ බව ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය වෙත දන්වා යවා ඇති අතර, අමාත්‍යාංශයේ තීරණය පරිදි ඉදිරි කටයුතු කරනු ඇත. | රාජ්‍ය මුදල් ආර්ථිකමය, ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්රතිලාභ සපුරා ගැනීමට හැකිවන ආකාරයට භාවිතා කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය ක්‍රියාත්මක කළ පහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ව්‍යාපෘති දුර්වල ප්‍රගතියක් පැවති බව නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලොකු ළූණු බීජ සහ කහ වගා කිරීමේ නිෂ්පාදන ගම්මානය ස්ථාපිත කිරීම සඳහා රු.14,580,865 ක වියදම් දරා තිබුණු අතර ඉලක්ක ගත අරමුණු 07 න් 06 ක් ව්‍යාපෘතිය හරහා ඉටු වී නොතිබුණු බැවින් නිෂ්පාදන ගම්මානය අපේක්ෂිත පරිදි ස්ථාපිත වී නොතිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් නිෂ්පාදන ගම්මානයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට යම් කාලසීමාවක් ගත වුවද මේ වන විට රජය විසින් කරනු ලැබූ සියළු මිලදී ගැනීම් ප්‍රතිලාභීන් වෙත බෙදා අවසන් අතර ප්‍රතිලාභීන් විසින් එම උපකරණ භාවිතයට ගනු ලැබේ. | නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසු ව්‍යාපෘති තෝරා ගෙන ලබා කරගත හැකි අරමුණු, කාර්යසාධන නිර්නායක සමඟ තීරණය කර, එම අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුවන අයුරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය පසුවිපරම් සිදුකරමින් ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා යොමු කළ යුතුය. |
| (ii) | කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ දේශීය වී නිෂ්පාදන ගම්මානය සඳහා නිෂ්පාදනයට ඍජුව සම්බන්ධ වූ වැව්, ඇලවේලි, අමුණු සකස් කිරීමට අදාල ක්‍රියාකාරකම් 05ක් සිදු නොකර වී නිෂ්පාදනයට වක්‍ර දායකත්වයක් ඇති මාර්ග ඉදි කිරීම, කාබනික පොහොර නිෂ්පාදනය, කමතක් ඉදි කිරීම, දැනුම ලබා දීම යන ක්‍රියාකාරකම් සඳහා රු.4,078,584 ක් වියදම් කර තිබුණු අතර අරමුණු අපේක්ෂිත පරිදි ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයෙන් පසු මේ සම්බන්ධව කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කර නොමැත. එම නිසා අපේක්ෂිත අරමුණු ඉලක්ක ලඟාකර ගැනීමට නොහැකි වී ඇත. නමුත් 2022 වර්ෂයේ "එක්ව කළමනාකරණ වැඩ සටහන " යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේශීය වී බීජ වී ගොවීන්ට ලබාදී ඇත. | ව්‍යාපෘතිවල ඵලදායි ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ග්‍රාම ශක්ති සමිති ක්‍රියාත්මක කිරීමේ ii අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ග්‍රාම ශක්ති සමිති 88 ක් අතරින් සමිති 60 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එම අක්‍රීය සමිතිවල 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,760,452 ක මුදල් ශේෂයක් පැවතුණි. | ග්‍රාම ශක්ති වැඩසටහන සම්බන්ධව උද්ගතව ඇති ගැටළු නිරාකරණ කිරීම සඳහා සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබාදුන් ලිපිය අවශ්‍ය කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ අරමුණු ඵලදායි ලෙස ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂිකාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබා දී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීම සඳහා වාණිජ කාර්යයක් වෙනුවෙන් භාවිතා කිරීමට එම ඉඩම්වලින් කොටසක් බැහැර කර ඇති අවස්ථාවලදී 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ vi කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ කුලුනු 139 ක් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | කෝමාරිකා වගා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, යාය 18 අංක 456 දරන ග්‍රාම නිලධාරී වසමේ ගොවීන්ට, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නේවාසික කටයුතුවලට හා ගොවිතැන් කටයුතුවලට බලපත්‍ර ලබාදී ඇති ඉඩම්වල මායිම් ගල් ඉවත් කර කෝමාරිකා වගාව සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක | මායිම් ගල් නැවත පිහිටුවීම සම්බන්ධයෙන් අදාළ ආයතනය දැනුවත්කර 2020.09.28 දින සහ 2022.09.05 දිනැතිව ලිපි යොමුකර ඇත. | මායිම් ගල් නැවත පිහිටුවීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2019 වර්ෂයේදී ලබා දී තිබුණි. එම ඉඩම් කැබලි නැවත රජයේ මිනින්දෝරු කාර්යාලයේ උපදෙස් පරිදි සිතියමට අනුව නැවතත් ගල් පිහිටුවා වෙන් කර දෙන ලෙස 2020 ජුනි 17 දින අනුරාධපුර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) විසින් රාජාංගනය ප්‍රාදේශීය ලේකම් වෙත දැනුවත් කර තිබුණ ද එපරිදි මායිම් ගල් නැවත පිහිටු වීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | කර්මාන්ත ශාලාවක් සහ ජල ටැංකිය හා ජල පිරිපහදුව කිරීම සඳහා දීර්ඝ කාලීන බද්දක් මත ඉඩම් කැබලි 02 ක් ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 සැප්තැම්බර් 16 දින අනුමැතිය ලැබී තිබුණ ද, 2023 අගෝස්තු 14 වූ විගණිත දිනය වන විට වසර 02 ක කාලයක් ගත වී ඇතත් දීර්ඝ කාලීන බදුකරයක් අත්සන් නොකර තිබුණි. මේ සම්බන්ධව මිනින්දෝරු අධිකාරී කාර්යාලයට මැනුම් ඉල්ලීම 2021 සැප්තැම්බර් 27 දින ඉදිරිපත් කර තිබුණු අතර දළ තක්සේරුව මත වසර 02 ක් සඳහා බද්දක් අයකර තිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබීම තුළින් රජයේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | 2024 වර්ෂයට අදාළ බදු මුදල් ගෙවා නොමැත. මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | දීර්ඝ කාලීන බලපත්‍ර ලබාදීම කඩිනම් කළ යුතුය. |
| (iii) | මධ්‍යම පරිසර අධිකාරියේ අංක NCPO/AD/07/1302/2019 දරන සහ 2019 සැප්තැම්බර් 24 දිනැති ලිපිය ප්‍රකාරව කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර තිබුණද අනුමැතිය ලබා නොගෙන කර්මාන්ත ශාලාව ඉදි කිරීමට යෝජිත ඉඩමේ අඩි 04 ක පමණ පස් තට්ටුවක් ඉඩමෙන් ඉවත් කර තිබුණි. | පිළිගෙන ඇත. | මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | ව්‍යාපෘතියට අදාළව මුදල් අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට 2021 අගෝස්තු 27 දින ඉදිරිපත් කර අනුමත කර ගත් යෝජනාවට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වගා ක්‍රමය යටතේ අපනයනය සඳහා කෝමාරිකා ශාකයෙන් ඖෂධීය නිෂ්පාදන කර්මාන්තයක් ආරම්භ කිරීම සහ සමස්ථ ආයෝජනය හා මූලික ආයෝජනය පිළිවෙලින් ඇ.ඩොලර් මිලියන 783 හා 300 ලබාගැනීම අරමුණු වුවද, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී වසර 02 ක පමණ කාලයක් ගත වී තිබුණද එම අරමුණු කිසිවක් ඉටු වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමක් නොමැති බව කාරුණික දන්වා සිටිමි. | ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළයුතු විම. |
| (ඇ) | 2023 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක ආපදාවට පත්වූ පුද්ගලයන් 53 ක් සඳහා තක්සේරු වටිනාකමින් ගෙවිමට ඉතිරි රු.1,439,366 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන විටත් ගෙවා නොතිබුණි. | ඇතැම් පුද්ගලයන්ගේ දේපළ පිහිටි ඉඩමේ හිමිකම සනාථ කර නොමැති බැවින් වන්දි ලබා දීමට හැකියාවක් නැත.පුද්ගලයන් කිහිප දෙනෙකුගේ වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ ලේඛන සොයා ගැනීමට නොහැකි බැවින් එම ඉල්ලීම් ලිපිවල සහතික කරන ලද පිටපත් මා වෙත යොමු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත. ඉතිරි වන්දි මුදල් ගෙවීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ප්‍රතිපාදන ඉල්ලා ඇත. 2020.04.01 දිනට පෙර සිදු වූ හානි දෙක සඳහා රක්ෂණ භාර අරමුදල මඟින් ඉතිරි මුදල් ගෙවීම සිදු කළයුතුය. | ආපදා මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 28 ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 26 ක් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 24 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 18 ක් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය මෙන්ම පුරප්පාඩු හා අතිරික්තයන් පිළිබඳව තොරතුරු නිවැරදි වේ. | කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක අනුමත වී තිබූ සංවර්ධන නිලධාරී තනතුරු ප්‍රමාණය ඉක්මවා නිලධාරීන් 95 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | අතිරික්ත සංවර්ධන නිලධාරීන් පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා මඟින් දැනුම්දීම් කර ඇත. | අතිරික්ත සංවර්ධන නිලධාරීන් පුරප්පාඩු ඇති කාර්යාලවලට අනුයුක්ත කළ යුතුය. |